# කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

---

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 13 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ එකී ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ උපකල්පන පිළිබඳ සටහන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දකුණු පළාත් පාලන කොමසාරිස් විසින් සමාලෝචිත වර්ෂයට අදාල සභික දීමනා ප්‍රතිපූර්ණය කිරීමේදී සභාවේ සභිකයින් 09 දෙනෙකුට ලබාදී ඇති යතුරුපැදි සඳහා රු.405,000 ක මුදලක් අඩුකර ගෙන තිබුණි. එකී මුදල ආදායම් හා වියදම් ගිණුමේ ආදායම් ආධාර යටතේද, වැටුප් හා දීමනා වියදම් යටතේද දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.41,650 ක් වූ ප්‍රාග්ධන වැය 109 සහ 309 වැය ශීර්ෂ 2 ක යටතේම ගිණුම් ගතවී ඇති බැවින් එකී වියදම ද්විගණනය වී ඇත. ඒ හේතුවෙන් ආදායම් හා වියදම් ගිණුමේ ප්‍රාග්ධන වැය එම ප්‍රමාණයෙන් වැඩිපුර දැක්විණි.

(ඇ) 2013 වර්ෂයේ ජර්නල් සටහන් 33 අනුව ගිණුම්වල සිදුව ඇති වරද නිවැරදි කිරීමට, 2014 වර්ෂයේදී සමුච්චිත අරමුදල් ගිණුමට රු.157,710 ක මුදලක් හර කර විවිධ ණයගැති ගිණුමට එකී මුදල බැර කළ යුතුව තිබුණි. එසේ වුවද ජර්නල් සටහන් 18 මගින් සමුච්චිත අරමුදල් ගිණුම රු.315,420 ක මුදලකින් හර කර විවිධ ණයගැති ගිණුමට එකී මුදල බැර කර තිබුණි. ඒ අනුව එකී ගිණුම්වලට රු.157,110 ක මුදලක් වැඩිපුර හරව සහ බැර වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී වෙනත් උපයෝගී සේවා වැඩ සටහන යටතේ දක්වා ඇති ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු වියදම වූ රු.589,692 ක මුදල තුල අත්තිකාරම් ලෙස ගෙවන ලද රු.200,000 ක මුදලක් සහ ගිණුම් මාරු රු.200,000 ක මුදලක් වශයෙන් රු.400,000 ක මුදලක් ඇතුළත්ව තිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දිනට තොග ලේඛනය අනුව ජල උපකරණ තොගය ජල මනු 59 ක් වූ අතර, එහි වටිනාකම රු.277,300 ක් විය. එසේ වුවද ජල මනු ඉතිරි තොගය ශේෂ පත්‍රයේ දක්වා තිබුණේ රු.94,400 ක් ලෙස රු.182,900 ක මුදලක් අඩුවෙනි. එසේම සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමට ජල සේවා වැඩ සටහන යටතේ ප්‍රාග්ධන වත්කම්, අළුත්වැඩියා හා නඩත්තු වැය ලෙස දක්වා ඇති රු.510,025 ක මුදල ගණනය කිරීමේදී අවසන් තොගය අඩුවෙන් තක්සේරු කිරීම නිසා රු.182,900 ක මුදලකින් එකී වියදමෙහි වැඩිවීමක් සිදුව තිබුණි. තවද වර්ෂය තුල ජල මනු 91 ක් නිකුත් කර තිබූ අතර ඒවායේ වටිනාකම රු.422,700 ක් විය. මෙම වියදම ප්‍රාග්ධන වියදමක් වුවද අළුත්වැඩියා හා නඩත්තු වැය යටතේ පුනරාවර්තන වියදමක් ලෙස දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ ලී බඩු හා සවිකිරීම් යනාදිය වැඩිදියුණු කිරීම් සහ මිලට ගැනීම් සඳහා වැය කර තිබුණු රු.2,064,697 ක ප්‍රාග්ධන වියදම් අයහාර වියදම් ලෙස ගිණුම් ගත කර තිබූ අතර එම ප්‍රාග්ධන වියදම මත සභාවට අයත් වූ වත්කම් ඒ ඒ වත්කම් විෂයය යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති මෝටර් රථ හා කරත්ත වටිනාකම වූ රු.19,432,655 ක මුදල තුල එකී වත්කම් නඩත්තු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.117,970 ක මුදලක් ප්‍රාග්ධනිත කර දක්වා තිබුණි.

(ඌ) 2014 ජනවාරි 01 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති මෝටර් රථ හා කරත්ත වටිනාකම වූ රු.2,924,725 ක මුදල තුල අංක 049-0267 කුබෝටා ට්‍රැක්ටරයේ (ට්‍රේලරය සහිත) වටිනාකම වන රු.225,000 ක් ඇතුළත්ව තිබුණි. මෙම ට්‍රැක්ටරය 2014 ඔක්තෝබර් 31 දින වෙන්දේසි කර ඇති අතර, මෙම වත්කම පොත්වලින් ඉවත් කිරීමට අදාල ජර්නල් සටහන් 29 අනුව ප්‍රාග්ධනයෙන් ආදායමට දායක වීමේ ගිණුම හර කර, මෝටර් රථ ගිණුමට බැර කිරීම වෙනුවට යන්ත්‍ර උපකරණ ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර උපකරණ වල වටිනාකම රු.225,000 කින් අඩුවෙන්ද මෝටර් රථ හා කරත්ත එකී මුදලින් වැඩියෙන්ද දැක්විණි.

(එ) ජර්නල් සටහන් 16 මගින් රු.1,420,062 ක මුදලක් යන්ත්‍ර උපකරණ ගිණුමට හර කර ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම බැර කර තිබුණද එකී මුදල තුල රු.159,947 ක් වූ අයහාර වියදම්ද ඇතුලත් වී තිබුණි.

(ඒ) කඹුරුපිටිය මාපලාන රටලංකාවත්ත ඉඩමේ ඉදිකෙරෙන ආදාහනාගාරය සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවන ලද සියයට 20 ක අත්තිකාරම් මුදල් වූ රු.3,288,747 ක මුදල අත්තිකාරම් ගිණුමට හර නොකර 309 වැය ශීර්ෂයට හර කර තිබුණි. ඒ අනුව එකී මුදලින් සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන වැය අධිගණනය වී තිබුණි.

(ඔ) ආදාහනාගාරයේ ගෑස් ලබා ගැනීමේ පොත අනුව 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරි ගෑස් තොගය ගෑස් කි. 240 ක් වූ අතර වටිනාකම රු.46,495 ක් විය. මෙම තොගය සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.9,700 ක හිඟ බලපත්‍ර ගාස්තු සඳහා නඩු පවරා තිබූ අතර, ජර්නල් සටහන් 31 මගින් එකී මුදල බලපත්‍ර ගාස්තු පාලන ගිණුම බැර කර සමුච්චිත අරමුදලට හර කර තිබුණද එය නඩු පවරන ලද හිඟ බලපත්‍ර ගාස්තු ගිණුමකට හර කළ යුතුව තිබුණි.

(ක) පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් පුර නැගුම ව්‍යාපෘතිය සඳහා සභාවට 2014 ජුනි 30 දින ලබාදී ඇති පරිගණක සහ උපකරණ වටිනාකම තක්සේරුකර ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් හයකට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.122,809,032 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.103,244,164 ක් වූයෙන් වෙනස රු.19,564,868 ක් විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

ඉකුත් වර්ෂවල සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.1,168,845 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි.

1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.18,683,671 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,412,540 ක් විය.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.65,318,085 ක් වටිනා ගිණුම් විෂයයන් 05 කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, අත්තිකාරම් ලේඛනය, උපලේඛන යනාදිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.7 බලය නොළත් ගනුදෙනු

(අ) සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන පෙර පාසැල් 38 ක් සඳහා 2013 හා 2014 ත්‍යාග ප්‍රදානය වෙනුවෙන් අභ්‍යාස පොත් හා බ්‍රවුන්පේපර් මලු ලබා ගැනීම සඳහා රු.199,700 ක මුදලක් වැයකර තිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඔ) වගන්තිය අනුව යම් අධ්‍යාපනික හෝ සුභ සාධක ආයතනවලට ආධාර පිණිස හෝ එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරනු ලබන ආධාර මුදලක් සහ අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් පූර්ව අනුඥාව ඇතිව ප්‍රාදේශීය සභාව විසින් ඒ කාර්යයන් සඳහා සම්මත කරනු ලබන වෙනත් ආධාර මුදලක් දියහැකි වුවද සභා අරමුදලින් රු.199,700 ක මුදලක් පෙර පාසැල් වලට පොත් ලබාදීමට 2013/2014 වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ වැයකර තිබුණ අතර එකී වියදම් සඳහා ඉහත පරිදි අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු.3,221,528 ක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,416,946 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් | 338 | 359 | 977 |
| කුලී මුදල් | 5,529 | 5,831 | 998 |
| බලපත්‍ර | 1,803 | 1,438 | 80 |
| වෙනත් ආදායම් හා ආධාර | 33,400 | 32,469 | 69,289 |

2.2.2 වරිපනම් බදු

2014 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු රු.747,063 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම් රු.313,179 ක්ද විය. 2014 වර්ෂයට අදාල බිල් කිරීම් වලින් රු.121,445 ක මුදලක්ද හිඟ ශේෂයෙන් රු.140,445 ක මුදලක්ද වර්ෂය තුල අයකරගෙන තිබුණි. හිඟ ශේෂයෙන් වර්ෂය තුල අයවීමේ ප්‍රගතිය සියයට 16 ක් තරම් සුළු අගයක් වූ අතර වර්ෂයේ බිල් කිරීම් අයවීමේ ප්‍රගතිය සියයට 39 ක් පමණ විය. 2014 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු රු.259,955 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා බිල්කිරීම් රු.22,250 ක් විය. වර්ෂය තුල හිඟ ශේෂයෙන් කිසිදු මුදලක් අයවී නොතිබුණ අතර, වාර්ෂික බිල් කිරීම් වලින් වර්ෂය තුල අයවීමේ ප්‍රගතිය සියයට 13 ක් පමණ විය.

2.2.3 ජල බදු

2014 ජනවාරි 01 දිනට හිඟ ශේෂය රු.1,194,584 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට අදාල බිල් කිරීම් රු.1,422,369 ක්ද වර්ෂයට අදාල අධිගාස්තු රු.392,130 ක්ද විය. වර්ෂය තුල හිඟ ශේෂයෙන් රු.444,070 ක් අයව තිබූ අතර හිඟ අයවීමේ ප්‍රගතිය සියයට 37 ක් පමණ විය. වර්ෂයට අදාල බිල් කිරීම් මත අයවීම් රු.864,185 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 61 ක් පමණ විය

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

3.1.1 සේවක ණය

සේවක ණය ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.2,336,514 ක් විය. එකී ශේෂය තුල 2004 වර්ෂයට පෙර සිට වාරික අය නොවන සේවකයින් 16 දෙදෙනෙකුට අදාල ණය ශේෂය රු.63,276 ක් විය.

3.1.2 මානව සම්පත් කළමනාකරණය

2014 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| තෘතියික | 01 | 01 | - | - |
| ද්විතියික | 26 | 23 | 03 | - |
| ප්‍රාථමික | 37 | 36 | 01 | - |
| වෙනත් | - | 26 | - | 26 |
| එකතුව | 64 | 86 | 04 | 26 |

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා දීමනා සඳහා රු.17,442,000 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය සඳහා කාර්ය මණ්ඩලයේ වැටුප් හා අනෙකුත් දීමනා සඳහා රු.24,877,930 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව රු.7,435,930 ක මුදලක් සභා අරමුදලට වැය බරක් වී තිබුණි. එය මුළු වැටුප් වියදමෙන් සියයට 30 ක් පමණ විය.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 පරිදි සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 පරිදි පළාත් පාලන ආයතනවල තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ වෙනයම් පදනමක් මත කරනු ලබන බඳවා ගැනීම් වහාම අත්හිටුවිය යුතු බව දක්වා තිබුණද ප්‍රාදේශීය සභාව 2014 වර්ෂයේදී සේවකයින් 26 දෙනෙකු බඳවා ගෙන සභා අරමුදලින් වැටුප් ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ස්වයං උත්පාදන ආදායම රු.21,762,445 ක් වූ අතර ඉන් වර්ෂය තුල මුදලින් ලැබීම් රු.14,957,267 ක් විය. සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම සඳහා සභා අරමුදලින් දරන ලද රු.7,435,930 ක මුදල වර්ෂය තුල මුදලින් ලද ස්වයං උත්පාදන ආදායමින් සියයට 52 ක් පමණ විය.

3.1.3 භෞතික සම්පත් කළමනාකරණය

සභාපති/උපසභාපති/වැඩ අධිකාරී කාර්මික නිලධාරී සහ සභාවේ ලේකම්වරයා විසින් බලය පවරනු ලබන වෙනත් කවර හෝ නිලධාරියෙකු යන අයගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මගින් සභාව ප්‍රයෝජනයට ගනු ලබන හා පදිංචියට ගනු ලබන සියළු ඉඩම් හා ගොඩනැගිලි 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 නියමය අනුව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කර නොතිබුණි.

3.1.4 මංමාවත් කළමනාකරණය

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සම්මත කරගෙන ඇති අයවැය ලේඛනයට අනුව සභාවට අයත් බල ප්‍රදේශය වර්ග කි.මී. 60,86 ක් වූ අතර ග්‍රාම නිලධාරී වසම් ගණන 39 කි. මුළු පාරවල් වල දිග කි.මී. 334.76 ක් වූ අතර තාර දැමූ. පස් හා කොන්ක්‍රීට් පාරවල්වල දිග පිළිවෙලින් කි.මී. 27 ක් ද , 245.76 ක් ද හා කි.මී. 62 ක් ද විය.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය අනුව ගැසට් මගින් ප්‍රසිද්ධ කර ඇති මාර්ග 42 ක් සභාවේ මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) මාර්ග ඉන්වෙන්ට්‍රි ලේඛනයක් පවත්වා ගොස් තිබුණද එහි ඇතුළත් කර තිබුණේ මාර්ග 405 ක් පමණි. මාර්ග 314 ක් සම්බන්ධයෙන් මාර්ගයේ ස්වභාවය (තාර, බොරළු, කොන්ක්‍රීට්) ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සඳහන් නොවූ අතර මාර්ග අංක 315 සිට 405 දක්වා මාර්ග වලට අදාලව දිග, සහ පළල ස්වභාවය ආදී කිසිවක් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සඳහන්ව නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සභාවේ අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) වියදම් පාලනය
(ඉ) ගබඩා පරිපාලනය
(ඊ) වත්කම් කළමනාකරණය